# 4 මිනිස්කම සුරකින පන්සිල්

බෞද්ධ සමාජය ගිහි පැවිදි යනුවෙන් දෙයාකාර වෙයි. පස්කම් සුව විඳිමින්, අඹුදරුවන් පෝෂණය කරමින්, පින්දහම් කරමින් දිවි ගෙවන උපාසක උපාසිකාවන් හැඳින්වෙන්නේ ගිහියන් යනුවෙනි. ඔවුහු ජීවිතයේ බොහෝ බලාපොරොත්තු ඇත්තෝ ය. එබැවින් ම සම්බාධක හෙවත් බොහෝ කරදර කම්කටොළු ඇත්තෝ ය. එහෙත් පෞද්ගලික ව තමන්ගේ ද පොදුවේ තම සමාජයේ ද සාමය, සමඟිය, සතුට හා දියුණුව ද සලසා ගනිමින් නිරවුල් ව, ආරක්ෂා සහිත ව තෘප්තිමත් ව ජීවත්වීම ගිහි පක්ෂයේ ද අරමුණයි. ඒ සඳහා අත්‍යවශ්‍ය වූ මානව හැඩගැස්ම පිළිබඳ මූලික පිළිවෙත පඤ්චශීලයයි. එමගින් එක් අතෙකින් පුද්ගලයා තමාට ද තමා ජීවත් වන සමාජයට ද හානිකර නො වූ නොයෙක් අයුරින් හිත සුව සලසන තැනැත්තකු බවට පත්වෙයි. එසේ ම බුදුදහම අනුව හෙතෙම ඒ ඔස්සේ සසර දුකින් අත්මිදීමේ පිළිවෙත පිරීමට අදාළ මූලික අඩිතාලම ද සකසා ගනියි.

ගිහි සමාජයෙහි ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය විසින් දිවිහිමියෙන් රක්නා බැවින් පඤ්චශීලය ගේහසිත ශීලය නම් වේ. ගිහි දිවිය ඇසුරු කළ ශීලය ගේහසිත ශීලයයි. ධන ධාන්‍යාදිය උපයන්නකු, අඹුදරුවන් පෝෂණය කරන්නකු, පස්කම් සුවය අත් නො හළ තැනැත්තකු වශයෙන් බෞද්ධ ප්‍රතිපත්ති මාර්ගය තුළ ආරක්ෂා කළ යුතු, පිළිපැදිය යුතු ශික්ෂණය පඤ්චශීලයෙන් උගන්වනු ලැබේ. නිත්‍යශීලය යනු ද පඤ්චශීලය හැඳින්වෙන යෙදුමකි. ගිහියකු නිතිපතා කඩ නොකොට රැකිය යුතු ශීලය යනු එහි අදහසයි. ගිහියකුට පොහොය අටසිල් හෝ ගිහි දසසිල් ද රැකිය හැකි ය. එහෙත් ඔවුන් නිබඳ ව ම රැකිය යුත්තේ පන්සිල් ය. පින්දහම් කරමින් පන්සිල් රකිමින් දැහැමින් අඹුදරුවන් පෝෂණය කරන එබඳු ශිෂ්ට සම්මත හැසිරීම් ඇති ගිහියකු දෙවියන්ට අධිපති ශක්‍රදෙවියන්ගේ පවා නමස්කාරයට ලක්වන්නේ යැයි බුදු දහමෙහි සඳහන් වෙයි.

පන්සිල් සුරකින තැනැත්තා සැබවින් ම නීති ගරුක ය. එසේ ම යුක්ති ගරුක ය. ඔහු මිනිසුන්ට මෙන් ම තිරිසන් සතුන්ට ද හිතවත් ය. හෙතෙම යුතුකම දකියි. මිනිස්කම හඳුනයි. සර්ව සාධාරණ වූ ඔහු අයුක්තිය පිටු දකින්නෙකි.

එබැවින් ම ඔහු සමාජය තුළ සතුටින් හා සාමයෙන් වසමින් සිය අනාගත දියුණුව සලසා ගැන්මෙහි ද සමත් වෙයි. සියලු ප්‍රාණීන් අතර, මිනිසා ශ්‍රේෂ්ඨ ය. ඒ ඔහු දියුණු කළ හැකි හැසිරීම් රටාවක් ද, දියුණු කළ හැකි සිතක් ද, නුවණක් ද ඇති එක ම සත්ත්වයා වන බැවිනි. එසේ දියුණු කළ හැකි සිත, කය හා වචනය දියුණු නො කොට ජීවත්වන තැනැත්තා මිනිස්කම ඇත්තෙක් නො වේ. ඔහු මිනිසකු වන්නේ නමින් පමණි. මිනිසාගේ ශ්‍රේෂ්ඨත්වය සැබැවින් ම අර්ථවත් වන්නේ මිනිස් ගුණ දහමින් ඔහු පෝෂණය වුව හොත් පමණි. එසේ නොවන්නෝ තිරිසනුන් හා සම වෙති. මිනිසා තිරිසනාගෙන් වෙනස් වන ප්‍රධාන කරුණ නම් ධර්මය බවත් ධර්මයෙන් තොර මිනිසුන් තිරිසනුන් හා සමාන බවත් පැරණි පඬිවරු ද සඳහන් කළහ. සැකෙවින් කිවහොත් මෙහි ධර්මය යන්නෙන් අදහස් කරන ලද්දේ හැදියාවයි. සිතින් කයින් හා වචනයෙන් ද තමාටත් සමාජයටත් හානිකර නොවූ ඵලදායී වූ හැසිරීමයි. එහි පදනම පන්සිල් රැකීමයි.

## පරපණ නැසීමෙන්, හිංසාවෙන් වැළකීම

මිනිසකුගේ හෝ වෙනත් පණ ඇති කවර සත්ත්වයකුගේ වුව ද ජීවිතය අන් සියල්ලට ම වඩා වටියි. අප විසින් ඉතා අගනේ යයි කියනු ලබන කවර සම්පතක් වුව ද රැකගැනීමට ජීවිතය රැකගත යුතු ය. ජීවත්වීමට අකැමැති, ජීවිතය රැකගැනීමේ බලාපොරොත්තුවක් නැති කිසිදු සත්ත්වයකු ලෝකයෙහි නැත. සියල්ලන්ට ජීවිතය ප්‍රිය යැයි බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන්හ. එසේ ම අන් අය විසින් හිංසා කරනු ලැබීමෙන් තොර ව, ඝාතනය කරනු ලැබීමෙන් තොර ව නිදහස් ව ජීවත් වීමේ අයිතිවාසිකම මිනිස් අයිතිවාසිකම්වල පළමුවැන්නයි. පර පණ නසන්නා, අනුන්ට හිංසා කරන්නා එම අයිතියට හානි කරන්නෙකි. එබැවින් ප්‍රාණඝාතය අත්හැර ඉන් සපුරා වැළකී පරපණ නසන්නට හිංසා කරන්නට භාවිත කරන දඬු මුගුරු අවි ආයුධ භාවිතයෙන් වැළකී පර පණ නැසීමේ මහා පාපය කිරීමට ලැජ්ජා වන්නකු ලෙස හික්මිය යුතු යැයි බුදු දහම උගන්වයි. එසේ ම සියලු ප්‍රාණීන්ගේ ජීවිතයට ගරුකරන, එය ආරක්ෂා කරන සියලු ප්‍රාණීන්ට කරුණා මෛත්‍රී සහගත වූ සිත් ඇත්තකු විය යුතු යැයි ද බුදුරජාණන් වහන්සේ වදාළහ. එමගින් එක් අතෙකින් පුද්ගලයා සමාජයෙහි ජීවත්වීමට සුදුස්සෙක් වෙයි. ඔහුගේ සිත ද කය ද අහිංසක වෙයි. රළු නපුරු ගති නැත්තෙක් වෙයි. ලෝකයාට ප්‍රිය මනාප අයෙක් වෙයි. දස අකුසල්වල පළමුවැන්න පර පණ නැසීම ය. දස කුසලයෙන් පළමුවැන්න ඉන් වැළකීම ය. සියලු සත්ත්වයනට

දයාව අනුකම්පාව ඇත්තකු වීම ය. එය මෛත්‍රියේ පදනමයි. තම මිතුරු සිත ලෝකය වෙත පැතිරවීමටත්, ලෝකයාගේ මිතුරුබව තමා වෙත ලබා ගැනීමටත් එමගින් අවස්ථාව සැලසෙයි. පරපණ නසන්නා ඉතා පහත් පුද්ගලයෙකි. ඔහු වසලයකු සේ හැඳින්විය යුතු බව බෞද්ධ ඉගැන්වීම ය. වසලයා යනු මිනිස් ගුණ දහම් නැති තැනැත්තා ය.

මෙසේ පර පණ නැසීම හානිදායක වන්නේත් එයින් වැළකීම ඉතා ඵලදායක වන්නේත් මෙලොව වශයෙන් පමණක් නො වේ. බුදු දහමෙහි උගන්වන පරිදි එය පරලොවට ද පැහැදිලි ව ම බලපායි. පර පණ නසන්නාගේ සිත ද්වේශයෙන් යුක්ත වූවකි. ඔහුගේ චේතනාව නොදියුණු ය; පහත් ය. හෙතෙම එමගින් මහා පාපයක් කර ගනියි. එසේ ම පරලොව වශයෙන් මරණින් මතු දුක් ඇති ආත්ම භාවයන්හි උපදියි. අඩු ආයුෂ ඇත්තෙක් ද වේ. පර පණ නැසීමෙන් වැළකී සියල්ලන්ට දයාවෙන් වසන්නාට සසර උපනූපන් ආත්මභාවයන්හි දීර්ඝායුෂ ලැබේ. එය බුදු වදනයි.

හැදෙන වැඩෙන දරුවකු වශයෙන් ඔබ ද පර පණ නැසීමෙන් හා අනුන්ට හිංසා පීඩා කිරීමෙන් වැළකිය යුතු ය. එය ඔබගේ මෙන් ම ඔබ සමග වසන සියල්ලන්ගේ ද මෙලොව පරලොව යහපත උදාකරයි. ඔබ ප්‍රිය මනාප අහිංසක ගුණවත් දරුවෙක් වේ. අනුන්ගේ ජීවත්වීමේ අයිතියට ගරු කර එය ආරක්ෂා කරන අයෙක් ද වෙයි. මතු ආත්මයේ ද සුගතියෙහි උපදියි. උපනූපන් ජාති දිගාසිරි ලැබේ.

## නුදුන් දේ ගැනීමෙන්, සොරකමින් වැළකීම

අප කවරකුට වුව ද ජීවිතය මෙන් ම අප සතු, අප පරිහරණය කරන දේපල ද අගනේ ය. ලොකු කුඩා සියලු සම්පත් අප විසින් ආරක්ෂා කරගත යුතු ය. පෞද්ගලික දේපලක්, පරිහරණය කරන දෙයක් තමා සන්තකයේ තබා ගැන්මට ඕනෑ ම පුද්ගලයෙක් කැමැති ය. එවැනි දේට අකැමැති මිනිසකු ලෝකයෙහි නැත. "සියලු සත්ත්වයෝ සැප කැමැති වෙති" යි බුදුරජාණන් වහන්සේ වදාළහ. සැප, සතුට හා ජීවිතයේ පහසුව ද පිණිස අපට පෞද්ගලික සම්පත් අවශ්‍ය වෙයි. එසේ ම අප සතු එබඳු පෞද්ගලික දේ අන් අය විසින් ඔවුන් සතුකර ගන්නවාට, සොරකම් කර ගන්නවාට හෝ පැහැර ගන්නවාට  අප කිසිසේත් ම කැමැති නැත. සෑම මිනිසකුට ම තමා සන්තකයෙහි පෞද්ගලික දේ තබා

ගැනීමට අයිතිවාසිකමක් ඇත. නුදුන් දේ ගැනීම, සොරකම හෙවත් අදත්තාදානය එම අයිතියට හානි කරයි. එය උදුරා ගනියි. එය ද මනුෂ්‍ය ධර්මයක් නො වේ. පහත් වූ වසල කමකි. අප සියලු දෙනා ම අන් අය සතු දෙයට (පර සන්තකයට) ගරු කළ යුතු ය. එය රැක දිය යුතු යැයි බුදුරජාණන් වහන්සේ වදාළහ. නුදුන් දේ ගැනීම අත්හැර, ඉන් වැළකී, දුන් දේ ගැනීම, දුන් දේ කැමැති වීම, අන් අය සතු දේ අවසරයකින්, කැමැත්තකින් තොර ව තමන් සතු කර ගැනීමේ පව්ටු සිතින් තොර වීම සැබෑ බෞද්ධයකුගේ යුතුකම ය. මෙසේ දෙවැනි ශික්ෂා පදය රකින්නා ද අයිතිවාසිකම් ගරුකරන, යුතුකම් ඉටු කරන හොඳ පුරවැසියෙක් වෙයි. ඔහු සමාජයෙහි ජීවත්වීමට දනී. ඒ සඳහා සුදුස්සෙක් වේ.

අදත්තාදානය හානිකර වන්නේ එය සිදු කරන පුද්ගලයාට පමණක් නො වේ. එය සමාජයට ද හානිකර ය. එසේ ම එය හානිදායක වන්නේ මෙලොවට පමණක් නො වේ. එය පරලොවට ද හානිකර ය. නුදුන් දේ ගැනීම අකුසලයකි. ආධ්‍යාත්මික පිරිහීමකි. එයින් පරලොව දුගතිගාමී වේ. උපනුපන් ජාති දිළින්දෙක් වේ යැයි බුදු දහම උගන්වයි. හැදෙන වැඩෙන දරුවකු ලෙස ඔබ ද කවර අයකුගේ වුව ද කවර දෙයක් වුව ද අනවසරයෙන්, අකැමැත්තෙන් නො ගත යුතු ය. අනුන්ගේ අයිතියට එසේ ගරු කරන, එය රකින ඔබට මෙලොව ද පරලොව ද යහපතක් ම වේ.

## කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීම

මිනිසා තිරිසනාගෙන් වෙනස් වන, තිරිසනා ඉක්මවා ශිෂ්ට සම්මත, ශීලාචාර, උසස් අයකු බවට පත්කරන තෙවැනි ශික්ෂාපදය හෙවත් සිල් පදය කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීම ය. ශිෂ්ට සම්මත ලෙස ස්ත්‍රී පුරුෂ සබඳතා පැවැත්වීම ය. ශිෂ්ට සම්මත නො වන, අශීලාචාර, අශික්ෂිත ස්ත්‍රී පුරුෂ සබඳතාව කාම මිථ්‍යාචාරයයි. එය අකුසලයකි. බුදු දහමෙහි පරදාර සේවනය ලෙස ද මෙය හැඳින්වෙයි. චතුර්විධ වූ කර්මක්ලේශ උගන්වන බුදුරජාණන්වහන්සේ පරදාර සේවනය ද ඉන් එකකැයි වදාළහ. ඒ ගිහි සමාජය සඳහා වදාළ සිගාලෝවාද සූත්‍ර දේශනාවේ ය. කාමයෙහි වරදවා හැසිරීම හෙවත් අනිසි ස්ත්‍රී පුරුෂ සම්බන්ධය මනුෂ්‍ය ධර්මයට ද පටහැනි ය. එය තිරිසන් ගතියකි. එයින් දුරු ව ශිෂ්ට සම්මත ලෙස කම් සුව විඳීමට බුදු දහම අනුව කිසිදු ගිහියකුට තහනමක් නැත. ආවාහ විවාහ මඟින් ආදියෙහි සිට ම මිනිසුන් යොමු වී ඇත්තේ එසේ ශිෂ්ට සම්මත

ගෘහ ජීවිතයකට මඟ සලසා ගැනීමටයි. මීට අදාළ වූ චාරිත්‍ර වාරිත්‍ර මෙන් ම නීති රීති ද දියුණු සමාජයෙහි දක්නට ලැබෙනුයේ එබැවිනි.

කාම මිථ්‍යාචාරය නිසා පවුලේ සාමය ද සුරක්ෂිත බව ද අඹු සැමි විශ්වාසය ද බිඳ වැටේ. මව හෝ පියා හෝ අශිෂ්ට ලෙස හැසිරෙන විට දරුවෝ ද නොමඟ යති. ඔවුහු සියල්ලෝ ම ශිෂ්ට සමාජය තුළ අවමන් විඳිති. තවත් බොහෝ ගැටලු ද එම පවුල් ඒකකය තුළ ඇති වේ. සෞඛ්‍යය ද පිරිහෙයි. සාමය ද බිඳ වැටෙයි. ඒ හේතුවෙන් ම දේපල ද අනාරක්ෂිත වේ. කාම මිථ්‍යාචාරය නිසා සිදුවන මානසික පිරිහීම අකුසල ධර්මයක් උපදවන බැවින් එහි ඵල විපාක වශයෙන් සසර දුක් විඳීමට ද සිදු වෙයි. මතු දුගතිවල උපදියි. හැදෙන වැඩෙන දරුවන් ලෙස ඔබ ද කුමර කුමරි බඹසර රැකගත යුතුයි. ශීලාචාර විය යුතුයි. එය ඔබේ අනාගත දියුණුවට ද හේතු වෙයි. ගුරු දෙගුරුන්ගේ ප්‍රශංසාව ද ආදරය ද එයින් ඔබට ලැබේ.

## බොරුකීමෙන්, මුසාවාදයෙන් වැළකීම

සමාජයේ ජීවත්වන කවර පුද්ගලයකුට වුව ද අන් අයගේ රැවටීම්වලින්, නොමඟ යැවීම්වලින් තොර ව ජීවත් වීමට සම්පූර්ණ අයිතිය තිබේ. එය මානව අයිතිවාසිකමකි. එසේ ම අන් අය නො රවටා, නොමඟ නො යවා ක්‍රියා කිරීමත් ඇත්ත කථා කිරීමත් අප සැමගේ ම යුතුකමකි. මුසාව, බොරුව, රැවටීම විවිධාකාර ය. සමහරු අනුන් රැවටීමේ අරමුණ චේතනාව ඇති ව බොරු කියති. බොරු පොරොන්දු දෙති. තවත් සමහරු බොරු සාක්ෂි දෙති. බොරු ගිවිසුම්වලට එළඹෙති. බොරු ප්‍රකාශන, නිවේදන කරති. ලිඛිත ව ද වාචික ව ද කරනු ලබන මෙබඳු කවර ක්‍රියාවක් වුව ද අකුසලයක්, වරදක් වේ. සමාජ විරෝධී ක්‍රියාවක් වේ. ඒ කවර ක්‍රියාවකින් වුව ද සිදුවන්නේ වරදකි. එයින් තමා විශ්වාසය තැබිය නො හැකි රැවටිලිකාරයෙක් වේ. මුසාවාදය අත්හැර, ඉන් වැළකී ඇත්ත, සත්‍යය ප්‍රකාශ කරන්නකු, ඇදහිය හැකි, පිළිගත හැකි ප්‍රිය වචන ඇති තැනැත්තකු වීමට පඤ්චශීල පිළිවෙතින් අපට උගන්වා ඇත. අනුන්ගේ රැවටිලිවලට අසුවීමට, එමගින් පාඩු අලාභ විඳගැන්මට විවිධ අපහසුතාවලට ලක්වීමට කිසිවකු කැමති නැත. තමා එබඳු දේට අකැමැති වන්නා සේ ම අන් අය ද අකැමැති වන බව

සලකා එබඳු දෙයින් වැළකීමට බුදු දහම උගන්වයි. බොරු කියන්නාට කළ නොහැකි පාපයක් නැතැයි බුදුරජාණන් වහන්සේ වදාළහ. හෙතෙම විළිබිය නැත්තෙකි. මිනිස් දහමට පටහැනි වන්නෙකි. බොරු කියන්නා, අනුන් රවටන්නා ආධ්‍යාත්මික වශයෙන් ද පිරිහෙයි. බාහිර සමාජයෙන් ද පිරිහෙයි. හෙතෙම මරණින් මතු පරලොව දී දුගතියෙහි ම උපදියි. දුකට පත් වෙයි. එය පහත් නොදියුණු චේතනාවෙන් කරනු ලබන අකුසල කර්මයක් වන බැවිනි.

හැදෙන වැඩෙන දරුවකු වශයෙන් ඔබ ද සත්‍යවාදී විය යුතු ය. අනුන් නො රැවටිය යුතු ය. එයින් ඔබට ද මිතුරන් මා පිය ගුරු දෙගුරු ආදීන් අතර විශ්වාසය සුරකින, පිළිගත හැකි වචන ඇති, ඇත්ත කථා කරන අවංක දරුවකු විය හැකි ය. එයින් මෙලොව ද පරලොව ද සිදුවන සෙත අපමණ ය.

## මත්වතුර, මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකීම

මත්වතුර, මත්ද්‍රව්‍ය ආදිය මිනිස් සිත විකෘති කරයි. උමතුවකට, වියවුලකට පත් කරයි. ඒ අනුව මත් වූ මිනිස්සු විකෘති, උමතු ක්‍රියා කරති. එබඳු වචන ද කියති. ඔවුහු සැබැවින් ම මිනිස්කමට නිගා කරති. පුද්ගලයන් වශයෙන් ඔවුහු සිතින් කයින් මෙන් ම වචනයෙන් ද පිරිහෙති. සිතින් නිවැරැදි ව නිරවුල් ව පැහැදිලි ව යමක් සිතා බැලීමට අසමත් වෙති. කයින් ඍජු ව සිටීමට ද නිරෝගී ව සිටීමට ද නිවැරැදි ව නිරවුල් ව ක්‍රියා කිරීමට ද ඔවුන්ට නො හැකි ය. වචනයෙන් ඍජු ව පැහැදිලි ව යහපත් යමක් පැවසීමට ද ඔවුහු අසමත් වෙති. තිදොරින් ම රෝගී බවට පත් වෙති. අවසානයේ දී ජීවිතය පවා අහිමි කර ගන්නා මත් ලෝලීන් මෙකල ද දක ගත හැකි ය. බුදු දහම අනුව මත්වතුර, මත්ද්‍රව්‍ය කෙරේ ලොල් වූ, ඇබ්බැහි වූ තැනැත්තාගේ ධනය බලා සිටිය දී ම වැනසී යයි. හෙතෙම දිළින්දෙක් වේ. කලකෝලාහලවලට ද හෙතෙම පැටලෙයි. සාමය සමගිය බිඳ වැටේ. ඔහු රෝගියෙක් බවට ද පත් වෙයි. කයින් ද පිරිහේ. නුවණ දුර්වල වේ. නිරවුල් කල්පනා ශක්තිය අහිමි වූවෙක් වෙයි. අපකීර්තිය පැතිරෙයි. ශිෂ්ට සමාජය ඔහු නො පිළිගනියි. මනසින් ද පිරිහෙන ඔහු නිතර කෝපයට ද පත් වෙයි. මෙබඳු තැනැත්තකුට, පෞද්ගලික ව ප්‍රීතිමත් දියුණු ජීවිතයක් ගෙවිය නො හැකි ය. එසේ ම සාමාජීය ව ද ඔහු ලෝකයාට මහත් පීඩාවකි. පිළිලයකි. හෙතෙම මෙලොව ද දුක් විඳී. මරණින් මතු පරලොව දුගතියෙහි ඉපිද දුකට පත් වෙයි.

හැදෙන වැඩෙන දරුවකු ලෙස ඔබ ද මෙම භයානක දුසිරිතෙහි, සමාජ විරෝධී ක්‍රියාවෙහි, බරපතල දුක් විපාක ඇති අකුසලයෙහි නපුර වටහා ගත යුතු ය. එයින් තමාට ද සමාජයට ද සිදුවන අවැඩ තේරුම් ගෙන දිවි ඇතිතාක් ඉන් වැළකී මනා සිහි නුවණ ඇති ශිෂ්ට මිනිසකු වීමට අධිෂ්ඨාන කරගත යුතු ය. එය ඔබගේ ද ඔබ වසන සමාජයේ ද යහපතට ම හේතු වෙයි.

**සාරාංශය**

පස් පවින් වැළකී පන්සිල් රකින්නා මිනිස් අයිතිවාසිකම් ගරු කරන්නෙකි. යුතුකම් ඉටුකරන්නෙකි. තමාට ද සමාජයට ද සෙත සදන්නෙකි. නීති ගරුක පුද්ගලයෙකි. තමාගේ ද සමාජයේ ද සාමය, සතුට හා දියුණුව සඳහා උපකාර කරන්නෙකි. හෙතෙම මෙලොව ද සතුටු වෙයි. සුවපත් වෙයි. පරලොව ද සතුටු වෙයි. සුවපත් වෙයි. බෞද්ධ දරුවකු වන ඔබ ද පන්සිල් සුරැකිය යුතු ය.

**ක්‍රියාකාරකම**

1. "පන්සිල් රැකීමෙන් නීතිගරුක පුද්ගලයෙක් වේ" මෙම කියමන පැහැදිලි කෙරෙන වාක්‍ය සතරක් ලියන්න.
2. මත්වතුර, මත්ද්‍රව්‍ය භාවිතයෙන් පුද්ගලයාට සිදුවන හානි හැකි තාක් සටහන් කරන්න.
3. පන්සිල් රැකීමේ අගය කියැවෙන කවි දෙකක් නිර්මාණය කරන්න.

**පැවරුම**

කුරුල්ලන්ට හා ලෙහෙණුන්ට ආහාර දීම සඳහා ඔබ නිවසේ කුස්සිය අසල සුදුසු ස්ථානයක් සකස් කරන්න.